## 1. දැක්ම

1. දැක්ම පිළිබඳ ප්‍රකාශය

දැක්ම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි දැක්ම වන්නේ පුරාවිද්‍යාවෙන් සහ එහි ශාඛාවලින් සහ සම්බන්ධිත විෂයන්ගෙන් ජාත්‍යන්තරව තරගකාරී විශේෂයන් සහ අදාල ක්ෂේත්‍රයේ විද්වතුන් සකස් කරනු ලබන උසස් අධ්‍යයනයේ කලාපීය ආයතනයක් වීමය.

## 2. මෙහෙවර ප්‍රකාශය

මෙහෙවර

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මෙහෙවර වන්නේ විශේෂඥයින්ට සහ උනන්දුවක් දක්වන මහජනතාවට අධ්‍යාපනික, බුද්ධිමය, ආර්ථික හා සමාජමය වරප්‍රසාද බෙදාහරිනු ලබන පුරාවිද්‍යාවේ හා සම්බන්ධිත විෂයන්ගේ ඉදිරිපත් කිරීම, භාවිතයට ගැනීම හා සන්නිවේදනය කිරීමයි.

හරය

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන සමුහක්ෂමතාවය මගින් මග පෙන්වනු ලබන පුරාවිද්‍යාවේ සහ සම්බන්ධිත විෂයන්ගේ බහුශ්‍රැත භාවයේ, නවෝත්පාදනයේ සහ සමාජමය වගකිව යුතු භාවයේ විශිෂ්ටත්වය පෝෂණය කරයි.

මුඛ්‍ය අරමුණ

ඉහළම මට්ටමේ පර්යේෂණවල නියැලීමේ හැකියාව ඇති සහ පුරාවිද්‍යාවේ සහ සම්බන්ධිත විෂයන්ගේ දැනුම සහ වෘත්තිය ප්‍රමිතියේ ප්‍රගමණයට අර්ථාන්විතව දායක විය හැකි තරගකාරි විශේෂඥයන් පුහුණු කිරීමට සහ එමෙන්ම එම දැනුම උනන්දුවක් දක්වන මහජනතාවට සුලභා කිරීමට

## 3. අධ්‍යක්ෂවරයාගේ කාර්ය සමාලෝචනය

**අ. සංක්ෂිප්ත හැඳින්වීම**

කැලණිය විශ්ව විද්‍යාලයානුබද්ධ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIAR) පුරාවිද්‍යාව හා තදශ්‍රිත විෂය පිළිබඳ විශේෂඥභාවය ලබනු රිසි ශාස්ත්‍රාභිලාෂීන් හා උද්‍යෝගිමත් මහජනතාව උදෙසා ශික්ෂණය, අධ්‍යයනය හා පර්යේෂණය ගැප් කොට ගත් පරිසරයක් සකස් කොට දීම මගින් පුරාවිද්‍යාව සහ තදශ්‍රිත විෂය දැනුම වර්ධනය කිරීමේ, ව්‍යාප්ත කිරීමේ හා සංරක්ෂණය කිරීමේ ස්වකීය ව්‍යවස්ථාගත මෙහෙවර ඉටු කරයි. තවද සංස්කෘතීන්ගේ ත්වරිත ගෝලීයකරණ යුගයක් තුළ සමාජයක සමාජීය හා ආර්ථික වර්ධනය ඇති කිරීමේදී සහ බිහිකිරීමේදී ඉතිහාසය, සංස්කෘතිය, උරුමය, කලාව සහ සාම්ප්‍රදයික ඥාන පද්ධතිය විෂයයෙහි වූ දැනුම ජීව පූර්ණ කාර්යභාරයක් ඉටු කරන බව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය තරයේ විශ්වාස කරයි.

**04 ශිෂ්‍යයන් පිළිබඳ විස්තර**

| ආයතනය | පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පශ්චාත් උපාධිය - --පුරාවිද්‍යාව | 49 | 10 | 25 |
| | පශ්චාත් උපාධිය - කෞතුකාගාර විද්‍යාව | 09 | -- | -- |
| | විද්‍යාපති | 45 | - | -- |
| | ශාස්ත්‍රපති | 06 | - | -- |
| | දර්ශනපති | 01 | - | -- |
| | දර්ශනසූරී | 03 | - | -- |
| එකතුව | | 113 | 10 | 25 |

**5. දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර**

| ආයතනය | පාඨමාලාව | මාධ්‍යය | ඇතුළත් වූ සංඛ්‍යාව | ප්‍රථම වසරේ ශිෂ්‍යයෝ | දෙවන වසරේ ශිෂ්‍යයෝ | තුන්වන වසරේ ශිෂ්‍යයෝ | හතරවන වසරේ ශිෂ්‍යයෝ | උපාධි ලත් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පශ්චාත් උපාධිය - --පුරාවිද්‍යාව | සිංහල/ ඉංග්‍රීසි | 49 | 44 | - | - | - | 22 |
| | පශ්චාත් උපාධිය - කෞතුකාගාර විද්‍යාව | | 09 | 09 | - | - | - | 11 |
| | උරුම පශ්චාත් උපාධිය | | - | - | - | - | - | - |
| | විද්‍යාපති | | 45 | | | - | - | 02 |
| | ශාස්ත්‍රපති | | 06 | | | - | - | 05 |
| | දර්ශනපති | | 01 | | | - | - | 01 |
| | දර්ශනසූරී | | 03 | | | | - | - |
| | ශාස්ත්‍රපති උරුම කළමනාකරණය | | - | - | - | - | - | 04 |

**6. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර**

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය හෝ | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය | සහකාර කථිකාචාර්ය | උපදේශක | සහකාර පුස්තකාලයාධිපති |
|---|---|---|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | පුරාවිද්‍යාව | සිංහල/ ඉංග්‍රීසි | - | 03 | 05 | 01 | - | - | 01 |
| එකතුව | | - | - | 03 | 05 | 01 | - | - | 01 |

**7. අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ විස්තර**

| ආයතනය | ජ්‍යෙෂ්ඨතම | ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය | කනිෂ්ඨ කාර්යමණ්ඩලය | කනිෂ්ඨ සේවක | අධ්‍යයන කාර්යමණ්ඩලය | ලිපිකාර/ශිල්පීය වෙනත් |
|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය | - | 03 | 02 | 04 | 02 | 14 |
| එකතුව | - | 03 | 02 | 04 | 02 | 14 |

**8. පර්යේෂණ, නවීකරණ යන ප්‍රකාශන**

| විෂය | ප්‍රකාශන | වෙළඳාමට | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පර්යේෂණ ගණන | 05 | | 05 |
| නවීකරණ ගණන | නැත | නැත | නැත |
| සඟරා ගණන | 01 | | 01 |
| පොත් ගණන | 03 | | 02 |
| ලිපි ගණන | 10 | | |
| වෙනත් | | | |
| | 19 | | 08 |

**9. වැඩසටහන් සම්මන්ත්‍රණ සහ වැඩමුළු විස්තර**

| විෂය | ප්‍රදනය කළ | නිම කළ | ඉදිරිපත් කළ |
|---|---|---|---|
| පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව | 03 | 02 | 02 |
| පශ්චාත් ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 |
| උපාධි වැඩසටහන් සංඛ්‍යාව | 02 | 02 | 02 |
| ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | | | |
| සහතික වැඩසටහන් සංඛ්‍යාව | | 01 | |
| වෙනත් | 02 | | |
| එකතුව | 08 | 06 | 05 |

**10. අලුතින් ආරම්භ කළ පාඨමාලා පිළිබඳ විස්තර**

| අධ්‍යයන අංශය | පාඨමාලාව | මාධ්‍යය | සහතික පත්‍ර | ඩිප්ලෝමා | ප. උ ඩිප්ලෝමා | පති | දර්ශනපති | දර්ශන සූරී |
|---|---|---|---|---|---|---|---|---|
| | පුරාවිද්‍යා පදනම් පාඨමාලාව | සිංහල | 65 | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| එකතුව | | | | | | | | |

**11. පුනරාවර්තන වියදම්**

'000

| විෂය | 2010 රු: | 2011 රු: |
|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 19,353 | 26,543 |
| ගමන් වියදම් | 69 | 248 |
| සැපයුම් | 1,244 | 1,466 |
| නඩත්තු | 767 | 732 |
| කොන්ත්‍රාත්තු සේවා | 5,252 | 5,473 |
| වෙනත් | 6,727 | 5,901 |
| ක්ෂය කිරීම් හැර එකතුව | 33,412 | 40,363 |

**12. ප්‍රාග්ධන වියදම් විස්තර**

'000

| විෂය | 2010 රු: | 2011 රු: |
|---|---|---|
| කාර්යාල ගෘහභාණ්ඩ හා උපකරණ ලබා ගැනීම | 1,246 | 5,484 |
| යන්ත්‍ර සූත්‍ර ලබා ගැනීම | | - |
| ගොඩනැගිලි හා ව්‍යුහ ලබා ගැනීම | 1,360 | 319 |
| වෙනත් (පුස්තකාල පොත්) | 545 | 584 |
| | | |
| එකතුව | 3,151 | 6,387 |

**13. ව්‍යාපෘති විස්තර (දේශිය/ විදේශිය අරමුදල් )**

| නම සහ විස්තර | ණය/ප්‍රදාන | අරමුදල් සපයන නියෝජ්‍යත්වය | TCE Rs. | RFA Rs. | DF Rs. |
|---|---|---|---|---|---|
| C.AC.S.Conservation by aboriginal culture. | | | 2,347 | | |
| කෞතුකාගාර ප්‍රදර්ශනය | | | 507 | | |
| යාපහුව ව්‍යාපෘතිය | | | 1,082 | | |
| පින්නවල ව්‍යාපෘතිය | | | 1,000 | | |
| රන්වමඩම ව්‍යාපෘතිය | | | 500 | | |
| නිලාගිරිසෑය ව්‍යාපෘතිය | | | 500 | | |
| නිකවලමුල්ල ව්‍යාපෘතිය | | | 400 | | |
| Paleo biodiversity Project | | | 600 | | |
| අලවල ව්‍යාපෘතිය | | | 865 | | |
| එකතුව | | | 7,801 | | |

14. ව්‍යාපෘති වියදම් විස්තරය ( දේශීය/ අරමුදල් )

’000

| නම | TCE Rs. | නිමා වන දිනය 2010 | නිමා වන දිනය 2011 | සමුච්චිත වියදම් 31. 12. 2011 | වෙනත් වියදම් % |
|---|---|---|---|---|---|
| | 2347 | 1236 | 1005 | 2241 | 95 |
| | 507 | 124 | 383 | 507 | 100 |
| | 1082 | - | 1082 | 1082 | 100 |
| | 1000 | - | 738 | 738 | 74 |
| | 500 | - | 485 | 485 | 97 |
| | 500 | - | 429 | 429 | 86 |
| | 400 | - | 01 | 01 | 0.25 |
| | 600 | - | 100 | 100 | 17 |
| එකතුව | 865 | - | - | - | 0 |

15. මුල්‍ය ප්‍රගතියේ විස්තර ( වියදම්)

| විෂය | ප්‍රතිපාදන 2011 | වියදම 2011 | ඉතුරුව/ අතිරික්තය |
|---|---|---|---|
| ව්‍යාපෘති ප්‍රාග්ධනය | 44,400 | 41,319 | 3,081 |
| ව්‍යාපෘති ප්‍රාග්ධනය | 20,000 | 6,387 | 13,613 * |
| දේශීය අරමුදල් | 6,441 | 4,223 | 2,218 * |
| විදේශීය අරමුදල් | - | - | |
| | | | |
| | | | |
| එකතුව | 70,841 | 51,929 | 18,912 |

*Continuing 2012

16. මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය 2010

| විෂය | Formula | ප්‍රතිශිෂ්‍ය වියදම |
|---|---|---|
| පුනරාවර්තන වියදම් ප්‍රතිශිෂ්‍ය ( පර්යේෂණ) | RE/No ශිෂ්‍ය සංඛ්‍යාව | 339 |
| ප්‍රතිශිෂ්‍ය ප්‍රාග්ධන වියදම | CE/No ශිෂ්‍ය සංඛ්‍යාව | 54 |
| | | |
| එකතුව | | 393 |

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

(කැළණිය විශ්ව විද්‍යාලය)

2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2011 | 2010 |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය | | |
| සාමාන්‍ය ක්‍රියාකාරකම් ඌනතාවය /අතිරික්තය | (4,045,876) | 3,597,240 |
| මුදල් චලනය කෙරෙහි බලනොපාන විෂයන් සඳහා ගැලපීම් | | |
| කපා හැරීම් | (5,515,427) | (5,367,137) |
| ක්ෂය | 5,515,427 | 5,387,355 |
| පාරිතෝෂික වෙන් කිරීම් | 2,522,115 | 1,278,532 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීමෙන් ලත් ලාභය | - | (758,581) |
| තොග (වැඩිවීම) /අඩුවීම | (104,619) | 366,436 |
| විවිධ ණය ගැතියෝ (වැඩිවීම) /අඩුවීම | (371,247) | - |
| කාර්ය මණ්ඩල ණය හා අත්තිකාරම් (වැඩිවීම) /අඩුවීම | (19,411) | (216,998) |
| මූලධන අත්තිකාරම් (වැඩිවීම) /අඩුවීම | (624,107) | 82,588 |
| සේවා සහ සැපයීම් අත්තිකාරම් (වැඩිවීම) /අඩුවීම | (528,922) | 11,305 |
| ඉදිරි ගෙවීම් (වැඩිවීම) /අඩුවීම | 55,830 | (4,810) |
| වෙනත් ජංගම වත්කම් (වැඩිවීම) /අඩුවීම | 24,372 | - |
| විවිධ ණය හිමියෝ වැඩිවීම / (අඩුවීම) | 385,775 | (418,949) |
| තැන්පත් (වැඩිවීම) /අඩුවීම | 62,800 | (15,500) |
| උපචිත වියදම් (වැඩිවීම) /අඩුවීම | 975,094 | 366,903 |
| වෙනත් වගකීම් වැඩිවීම /(අඩුවීම) | (1,560,917) | 2,750,708 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | (3,229,114) | 7,059,092 |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම | (6,369,520) | (7,593,162) |
| වාහන අලෙවිය | - | 850,803 |
| ස්ථාවර තැන්පත් | | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (6,369,520) | (6,742,359) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ප්‍රතිපාදන -පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් | 5,000,000 | 400,000 |
| මූලධන ප්‍රතිපාදන -පුස්තකාල පොත් | 200,000 | 600,000 |
| මූලධන ප්‍රතිපාදන -ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම් | 14,800,000 | 1,800,000 |
| මූලධන ප්‍රතිපාදන -ස්ථාවර ඉදිකිරීම් | - | 5,000,000 |
| ත්‍යාග සහ පරිත්‍යාග | - | - |
| විශේෂ අරමුදල් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | 20,000,000 | 7,800,000 |
| මුදල් හා මුදල් හා සමාන විෂයයන්ගේ ශුද්ධ වැඩිවීම / අඩුවීම් | 10,401,366 | 8,116,733 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | 14,205,420 | 6,088,687 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන විෂයන්ගේ ශේෂය | **24,606,786** | **14,205,420** |

## පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
## 2011/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ වත්කම් චලනය

| | ප්‍රතිපාදන | පොදු සංචිත | විශේෂ සංචිත | එකතුව |
|---|---|---|---|---|
| 2006/12/31 දිනට ශේෂය | **51,541,072** | **(23,534,574)** | **7,473,130** | **35,479,628** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 21,300,000 | - | 785,285 | 22,085,285 |
| 2007 වර්ෂයේ ඌනතාවය | - | (196,208) | - | (196,208) |
| 2007/12/31 දිනට ශේෂය | **72,841,072** | **(23,730,782)** | **8,258,415** | **57,368,705** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 19,135,000 | - | - | 19,135,000 |
| 2008 වර්ෂයේ ඌනතාවය | - | (3,220,480) | 483,878 | (2,736,599) |
| 2008/12/31 දිනට ශේෂය | **91,976,072** | **(26,951,262)** | **8,742,293** | **73,767,106** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 1,900,000 | - | - | 1,900,000 |
| කපා හැරීම් | (5,347,786) | - | - | (5,347,786) |
| 2009 වර්ෂයේ ඌනතාවය | - | (724,818) | 353,303,621 | 352,578,803 |
| 2009/12/31 දිනට ශේෂය | **88,528,286** | **(27,676,080)** | **362,045,914** | **422,898,123** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 7,800,000 | - | 1,501,394 | 9,301,394 |
| කපා හැරීම් | (5,367,137) | - | - | (5,367,137) |
| 2010 වර්ෂයේ ඌනතාවය / අතිරික්තය | - | 3,597,240 | - | 3,597,240 |
| 2010/12/31 දිනට ශේෂය | **90,961,149** | **(24,078,840)** | **363,547,308** | **430,429,620** |
| රජයේ හා අනෙකුත් ප්‍රතිපාදන වැඩිවීම | 20,000,000 | 89,024 | 2,809,578 | 22,898,602 |
| කපා හැරීම් | (5,515,427) | - | - | (5,515,427) |
| 2010 වර්ෂයේ ඌනතාවය / අතිරික්තය | - | (4,045,876) | - | (4,045,876) |
| 2011/12/31 දිනට ශේෂය | **105,445,722** | **(28,035,692)** | **366,356,886** | **443,766,919** |

5 (b)

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
(කැළණිය විශ්ව විද්‍යාලය)

**2011-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍යමය ක්‍රියාකාරිත්ව ප්‍රකාශනය**

| මෙහෙයුම් ආදායම් | 2011 | 2010 |
|---|---|---|
| පුනරාවර්ථන ප්‍රතිපාදන | 32,494,457 | 33,639,960 |
| ණය පොළී | 265,874 | 261,547 |
| මිශ්‍ර ආදායම් | 274,511 | 469,075 |
| ලියාපදිංචි ගාස්තු(පශ්චාත් උපාධි) | 184,500 | 266,200 |
| පාඨමාලා ගාස්තු(පශ්චාත් උපාධි) | 2,926,100 | 1,376,000 |
| විභාග ගාස්තු(පශ්චාත් උපාධි) | 105,500 | 139,000 |
| කපා හැරීම් | 5,515,427 | 5,367,137 |
| ප්‍රකාශන අලෙවිය | 54,175 | 80,774 |
| දේපල වලින් ලත් කුලී | 12,500 | 37,846 |
| එකතුව | **41,833,043** | **41,637,539** |
| **මෙහෙයුම් වියදම් (ක්ෂයවීම් ඇතුළුව)** | | |
| වේතන (පරිපාලන හා කාර්‍ය මණ්ඩල) | 26,543,253 | 19,352,546 |
| ගමන් වියදම් | 248,199 | 69,028 |
| සැපයීම් හා පාරිභෝජන අවශ්‍යතා | 1,466,460 | 1,244,339 |
| නඩත්තු වියදම් | 731,796 | 766,953 |
| ගිවිසුම් ගත සේවා | 5,472,679 | 5,251,554 |
| පර්යේෂණ හා සංවර්ධන | 471,750 | 34,200 |
| ක්ෂය වීම් | 5,515,427 | 5,387,355 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 5,429,355 | 6,692,905 |
| එකතුව | **45,878,919** | **38,798,880** |
| ක්‍රියාකාරි මෙහෙයුම් අතිරික්තය/ඌනතාවය | **(4,045,876)** | **2,838,659** |
| මූල්‍ය පිරිවැය | | |
| දේපල/ උපකරණ අලෙවියෙන් ලත් ආදායම | | 758,581 |
| අදාල කාලයට ශුද්ධ අතිරික්තය /ඌනතාවය | **(4,045,876)** | **3,597,240** |
| පසුගිය වර්ෂයෙන් ඉ/ගෙ ශේෂය | (23,989,816) | (27,676,080) |
| අදල වර්ෂයේ අතිරික්තය /ඌනතාවය | (4,045,876) | 3,597,240 |
| ඉදිරියට ගෙන ගිය පොදු සංචිතය | **(28,035,692)** | **(24,078,840)** |

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
(කැළණිය විශ්ව විද්‍යාලය)
**2011-12-31** දිනට මූල්‍යමය ප්‍රකාශනය

| | 31.12.2011 | | 31.12.2010 | |
|---|---|---|---|---|
| වත්කම් | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| දේපල යන්ත්‍ර හා උපකරණ | 407,696,651 | | 406,871,358 | |
| ආයෝජන | | | | |
| ස්ථාවර තැන්පතු | 1,302,838 | 408,999,489 | 1,198,663 | 408,070,021 |
| ජංගම වත්කම් | | | | |
| තොගය / ගබඩා අත්තිකාරම් | 1,689,991 | | 1,585,372 | |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | 494,335 | | 123,088 | |
| කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම් | 6,643,700 | | 6,624,289 | |
| මූලධන අත්තිකාරම් | 1,355,554 | | 430,335 | |
| සේවා සහ සැපයුම් අත්තිකාරම් | 776,352 | | 247,430 | |
| ඉදිරි ගෙවීම් | 76,274 | | 132,104 | |
| වෙනත් ජංගම වත්කම් | 5,299,077 | | 5,323,449 | |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 24,606,786 | 40,942,070 | 14,205,420 | 28,671,487 |
| **වත්කම් එකතුව** | | **449,941,559** | | **436,741,508** |
| වගකීම් | | | | |
| ජංගම වගකීම් | | | | |
| විවිධ ණය හිමියෝ | 623,282 | | 237,507 | |
| තැන්පත් | 108,781 | | 45,981 | |
| උපචිත වියදම් | 2,364,139 | | 1,389,045 | |
| වෙනත් වගකීම් | 3,078,441 | 6,174,643 | 4,639,358 | 6,311,891 |
| ජංගම නොවන වගකීම් | | | | |
| වැය වූ මූලධන | 88,134,456 | | 87,487,604 | |
| වැය නොවූ මූලධන | 17,311,267 | 105,445,723 | 3,473,545 | 90,961,149 |
| විශේෂ අරමුදල් | 353,177,157 | | 352,907,594 | |
| ත්‍යාග සහ පරිත්‍යාග | 3,501,656 | | 3,483,755 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | 9,678,074 | 366,356,886 | 7,155,959 | 363,547,308 |
| **වගකීම් එකතුව** | | **477,977,251** | | **460,820,348** |
| **ශුද්ධ වත්කම් එකතුව** | | **(28,035,692)** | | **(24,078,840)** |
| ශුද්ධ වත්කම් /හිමිකම | | | | |
| පොදු සංචිතය | (28,035,692) | | (24,078,840) | |
| | | (28,035,692) | | (24,078,840) |
| ශුද්ධ වත්කම් / හිමිකම් එකතුව | | **(28,035,692)** | | **(24,078,840)** |

මහාචාර්ය ජගත් වීරසිංහ
අධ්‍යක්ෂ

ඩී.එස්. පි කුමාරසිංහ
නියෝජ්‍ය මූල්‍යාධිකාරි

5 (d)

# වාර්ෂික වාර්තාව 2011

මහාචාර්ය රාජ් සෝමදේව

**(අ) කරන ලද පර්යේෂණ:**

1. දඩයක්කාර-එලවැල රැස්කරන්නන් මූලික ගොවිතැන් වෙත පරිවර්තනය වීමේ ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීම පිළිබඳ දත්ත එක්රැස් කිරීමේ ක්‍රමයක් ලෙස රංචමඩම ප්‍රාග් ඓතික භූමියේ කැණීම් කටයුතු සිදු කිරීම. (2011 පෙබරවාරි)

2. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කර ගෙන යන ලද නිල්ගිරිසෑය සංරක්ෂණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස ලාහුගල වනසත්ව අභය භූමියේ සිදු කරන ලද සමීක්ෂණ ගවේෂණය. (2011 ජූනි)

3. උඩවලවේ ද්‍රෝණියේ පුරාවිද්‍යාත්මක වටිනාකම පිළිබඳව කරගෙන යනු ලබන දත්ත සමුද්ධරණය ක්‍රමයක් ලෙස හල්දුම්මුල්ලේ සිදු කරන ලද කැණීම්. (2011 ජූලි-අගෝස්තු)

4. සංස්කෘතික සහ කලා කටයුතු අමාත්‍යාංශය විසින් අරමුදල් සපයන ශ්‍රී ලංකාවේ ගල් ගුහා චිත්‍ර සහ කැටයම් භූමිවල ව්‍යාපෘතියේ දත්ත සමුද්ධරණ ක්‍රමයක් ලෙස ගල් ගුහා චිත්‍ර සහ කැටයම් භූමිවල සිදු කරන ලද සමීක්ෂණ ගවේෂණය.

**(ආ) සම්මන්ත්‍රණ:**

1. 2011 ජාතික පුරාවිද්‍යාත්මක පරිසංවාදයේ දී ඉදිරිපත් කරන ලද 'උඩවලව ද්‍රෝණියේ පුරාවිද්‍යාවේ ප්‍රතිඵල'.

**(ඇ) ප්‍රකාශන**

1. '**උඩවලව ද්‍රෝණියේ පුරාවිද්‍යාවේ ප්‍රතිඵල** ' ප්‍රස්ථාවික ලිපි අංක 2. කොළඹ: පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

**(ඈ) ප්‍රසිද්ධ මාධ්‍ය**

**මුද්‍රණය.** සෝමදේව, ආර්. 2011. *'කැන්ඩි: අ සිටි ඔෆ් ඉමැජිනේෂන්.'* ශ්‍රී ලංකා වාර සඟරාව, 3වැනි කාර්තුව, 2011. කොළඹ: රාජ්‍ය තොරතුරු දෙපාර්තමේන්තුව.

සෝමදේව, ආර්. 2011. *'සිගිරිය ඇන්ඩ් ඉට්ස් කල්චරල් ලෙගසි'*. ශ්‍රී ලංකා වාර සඟරාව, 2වැනි කාර්තුව, 2011. කොළඹ: රාජ්‍ය තොරතුරු දෙපාර්තමේන්තුව.

සෝමදේව, ආර්. 2011. *'ඩිකන්ස්ට්‍රක්ටින් හිස්ට්‍රි'*. රාවය, ජූලි පළමු සතිය, 2011.

ආචාර්ය රෝස් සෝලංගාරච්චි - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

2011:

**පවත්වන ලද පර්යේෂණ:**

2011**:**

(1) බලංගොඩ කලාපයේ (ඉහළ වලවේ-බටහිර) ඓතිහාසික යකඩ සහ කෝව වානේ භූමිවල මානව පුරාවිද්‍යාත්මක සමීක්ෂණය
(2) බලංගොඩ මාමල්ගහ පිහිටි උඩුකුඹුර වත්ත වානේ නිෂ්පාදන භූමිය කැණීම.

**ප්‍රකාශන:**

2011:

(1) ජාතික කෞතුකාගාරයේ *SpoliaZeylenica* ප්‍රකාශනය සඳහා "සීගිරියේ යකඩ ඇණ සම්බන්ධ ලෝහ විද්‍යාත්මක ගවේෂණ" ඉදිරිපත් කරන ලදී.

**කටයුතු කරමින් පවතින:**

(1) "සීගිරිය-දඹුල්ල ප්‍රදේශයේ දෙහිගල ඇළ කන්ද ලෝහ උණු කිරීම පිළිබඳ ලෝහ විද්‍යාත්මක සමාලෝචනය" පිළිබඳ ලිපිය පුරාවිද්‍යාත්මක වාර සඟරාවේ පළ කිරීමට නියමිතය.
(2) "ශ්‍රී ලංකාවේ මහා ශිලා සන්දර්භය තුළ චාරිත්‍රානුකූල පරිචයන් පිළිබඳ සංකේතවාදය" පිළිබඳ ලිපිය "ඉබ්බන්කටුව මහා ශිලා සන්දර්භයේ පුරාවිද්‍යාව" හි පළ කිරීමට නියමිතය.
(3) බලංගොඩ මාමල්ගහ පිහිටි උඩුදුම්බර වත්ත වානේ නිෂ්පාදන භූමියේ යකඩ උණු කිරීම සහ කැණීම පිළිබඳ මානව පුරාවිද්‍යාව පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුරාවිද්‍යාත්මක නිබන්ධන මාලාවේ ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.
(4) ඇමෙරිකා එක්සත් ජනපදයේ ෆ්ලොරිඩා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කරන ලද "ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ කිරිඔය ද්‍රෝණියේ ඓතිහාසික යකඩ උණු කිරීමේ තාක්ෂණය සහ ජනාවාස පිහිටුවා ගැනීමේ රටාව" පිළිබඳව ආචාර්ය උපාධි නිබන්ධනය පොතක් ලෙස පළ කිරීම.

## ප්‍රගති වාර්තාව (2010)

ආචාර්ය ටී. ආර්. ප්‍රේමතිලක / ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 1 ශ්‍රේණිය

1. සාරාංශය

එක්සත් ජනපදයේ ක්වීන්ස් විශ්ව විද්‍යාලයේ (QUB) භූගෝල විද්‍යා, පුරාපාරිසරික විද්‍යා සහ පුරා විද්‍යා විද්‍යායතනයේ දී මාගේ පශ්චාත් ආචාර්ය පර්යේෂණ වැඩසටහන අවසන් කළ පසු මම ශ්‍රී ලංකාවේ පශ්චිම චාතුර්ථක දේශගුණ සහ පාරිසරික වෙනස්වීම්වල විස්තරාත්මක පර්යේෂණ වැඩසටහනක් සමග 2009 වර්ෂයේ මැද භාගයේ දී පුරා විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙත පැමිණියෙමි. මෙම ක්‍රියාවලියෙහි දී ශ්‍රී ලංකාවේ පුරා පරිසර විද්‍යාව සහ පුරාවිද්‍යාව යන විෂයයන් සන්දර්භයෙන් අනාගත පර්යේෂණ සැලසුම් / ක්‍රියාකාරකම් සාකච්ඡා කිරීමේ විස්තරාත්මක සාකච්ඡාවක් මා හා පුරා විද්‍යාත්මක විද්‍යා ජර්නලයේ සංස්කාරක මහාචාර්ය

වෛද්‍ය සීචි. එච්. හන්ට් (QUB) අතර පැවැත්වුණි. මේ සම්බන්ධයෙන්, මා හට අනෙකුත් අන්තර්ජාතික සහ ජාතික ආයතන ගණනාවක් සමග පර්යේෂණ සහයෝගිතාවය වැඩි දියුණු කිරීමේ අවස්ථාවක් හිමි විය. මෙම පසුබිම සමග මා හට ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ මිහිදන් පුරා විද්‍යාත්මක සහ පුරා පාරිසරික විද්‍යා ගවේෂණය සඳහා නව පර්යේෂණ මෙවලමක් ලෙස, ශාඛ සිලිකා ස්ථර වින්‍යාස වැඩි දියුණු කිරීමට සහ ලද හැකි පුරා පාරිසරික විද්‍යා පර්යේෂණ සමග කටයුතු කිරීමට ඉන්දියාවේ පොන්ඩිචෙරිහි ප්‍රංශ ආයතනයෙහි පර්යේෂණ සහායකයෙකු ලෙස කටයුතු කිරීමට මා හට ආරාධනා ලැබුණි. මෙම වැඩසටහන POLLANDCAL සහ LANDCLIM ඔස්සේ යුරෝපය පුරා විසිරුණු ක්‍රම භාවිතා කරමින් නිවර්තන ප්‍රදේශවල බිම් ආවරණය ප්‍රතිසංස්කරණය, දකුණු ආසියාවේ පුරා පරිසර සංශ්ලේෂණයක් ලබා දීම ද ඉලක්ක කොට ගන්නා ලදී. බොහොමයක් නිවර්තන ප්‍රදේශවල මානව කර්තෘක බිම් ආවරණ ප්‍රතිසංස්කරණය සඳහා අමතර තොරතුරු ලෙස ලබා ගත හැකි අදාළ ඓතිහාසික සහ පුරා විද්‍යාත්මක දත්ත සංශ්ලේෂණයෙහි අඩංගු විය. මෙය අන්තර්ජාතික භූගෝල/ ජෛව ගෝල වැඩසටහන (IGBP) සහ පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය විසින් අනුග්‍රාහකත්වය දක්වන ලද අන්තර් ජාතික පර්යේෂණ වැඩසටහනකි. පසුව ඉක්මණින්ම, එක්සත් රාජධානයේ, බෙල්ෆාස්ට් හි ක්වීන්ස් විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා, පුරා පාරිසරික විද්‍යා සහ පුරාවිද්‍යා විද්‍යායතනයේ දී "ශ්‍රී ලංකාවේ සහල් වගාවේ පුරෝගාමිත්වය සහ විකාසනය අන්වේක්ෂණය කිරීම" යන පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කිරීමට එක්සත් රාජධානියෙහි බ්‍රිතාන්‍ය ඇකඩමිය විසින් මාස හයක කාලයක් සඳහා පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී. මෙම පත් කිරීම විධිමත් හුවමාරු වැඩ සටහනක අංගයක් වූ බැවින් මා අධ්‍යයන ආගන්තුකයෙකුගේ නිර්ණායක සපුරා තිබිණි. මෙම ව්‍යාපෘතියෙහි ප්‍රතිඵල ඉතා සුවිශේෂී වූ අතර, දකුණු සහ ගිනිකොණ දිග ආසියාවේ කෘෂිකාර්මික මූලාරම්භයන්, සංස්කෘතික ජෛව භූගෝල විද්‍යාව සහ පුරා විද්‍යාව කෙරෙහි ඉහළ බලපෑමක් පෙන්වන බව දිස් විය. එබැවින් මෙම ව්‍යාපෘතියෙන් පුරා විද්‍යාත්මක විද්‍යා සඟරාවට සැකසූ ප්‍රකාශනයන් විචාරකයන් ගණනාවකගේ අදහස් දැක්වීම් සහ යෝජනා අනුගමනය කරමින් දැන් ප්‍රතිශෝධනය යටතේ පවතී. අන්තර්ජාතික අවස්ථාවන් ගණනාවකදී, සුවිශේෂී ලෙසම අතීත මානව ප්‍රේරිත පරිසර හා සම්බන්ධ මාගේ දේශගුණ සහ පාරිසරික පර්යේෂණ වැඩ හා ආශ්‍රිත වාචික සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් ඉදිරිපත් කිරීමට මා වෙත ඇරයුම් ලැබිණි. ආචාර්ය ප්‍රේමතිලකගේ මෙම ක්‍රියාවලීන්, පර්යේෂණ අභිරුචි සහ ජයග්‍රහණයන් සඳහා හැඳින්වීමක් පහත පරිච්ඡේද වලින් දැක්වෙයි.

2. අන්තර්ජාතික සහ ජාතික සහයෝගිතාවය යටතේ වර්තමාන පර්යේෂණ / පශ්චාත් උපාධි මට්ටමේ අධ්‍යාපනය

කරගෙන යන ව්‍යාපෘති මාතෘකා :

1. මධ්‍යම ශ්‍රී ලංකාවේ හෝටන් තැන්නේ පශ්චිම චාතුර්ථක (පසුගිය අවුරුදු 25000) පාරිසරික සහ දේශගුණික වෙනස්වීම්

2. ශ්‍රී ලංකාවේ නිම්න භූමි ජීර්ණක ගොහොරුවල හොලොසින (පසුගිය අවුරුදු 10,000) දේශගුණික සහ පාරිසරික වෙනස්වීම්

3. ප්‍රධාන භෝග ශාක හඳුන්වාදීම සමග ශ්‍රී ලංකාවේ අවසන් ඓතිහාසික කාල පරිච්ඡේද තුළ භූ දර්ශන වෙනස්වීම්

4. ශ්‍රී ලංකාවේ යාපහුව, ගල් සොහොන් කනත්ත මහා ශිලා මිහිදන් බිමෙන් රැස් කළ අවසාදිත / පාංශුවල පරාග විද්‍යාත්මක විමර්ශනය

5. පොරුන්තාල් (දකුණු ඉන්දියානු මිහිදන් බිම) සහ දකුණු ඉන්දියාවේ වැව් බිම් ගණනාවක ඇති ශාක සිලිකාවල (සිලිකාමය ක්ෂුද්‍ර පොසිල) පුරා විද්‍යාත්මක සම්බන්ධය

7. ශ්‍රී ලංකාවේ පශ්චිම ප්ලෙයිස්ටොසීන සහ හොලොසින ශාක භාවිතය : පාහියන් ගල් ගුහාවේ නික්ෂේපනයන්හි ශාක සිලිකා විමර්ශනය

8. කෙසෙල්වල පෙර මුහුදුබඩ අපහරණය : ශ්‍රී ලංකාවෙන් සාක්ෂි

3. සහයෝගිතා ආයතන : පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය (PGIAR), ජාතික පර්යේෂණ සභාව (ශ්‍රී ලංකාව) භූගෝල විද්‍යා, පුරා පරිසර විද්‍යා, පුරා විද්‍යා විද්‍යායතනය, ක්වීන්ස් විශ්ව විද්‍යාලය, (එක්සත් රාජධානිය), කිව් උද්‍යානය (එක්සත් රාජධානිය), පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ලුන්ඩ් විශ්ව විද්‍යාලය (ස්වීඩනය), පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය (ඉන්දියාව) පුරා විද්‍යාත්මක මැනුම් දෙපාර්තමේන්තුව (ශ්‍රී ලංකාව) සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය (ශ්‍රී ලංකාව).

4. ශ්‍රී ලංකාවේ වැඩ බිම් / සංරක්ෂිතඃ හෝටන් තැන්න, නුවරඑළිය, මුතුරාජවෙල (මීගමුව කළපුව) සිරිගම්පොල (වෙන්නප්පුව), ඇස්වත්ත (අවිස්සාවේල්ල), අලුත්වල (හික්කඩුව), සහ පුපුරුස්ස (ගම්පොළ), පාහියන් ගල් ගුහාව (බුලත්සිංහල) සහ ගල්සොහොන්කනත්ත (යාපහුව).

5. ඉන්දියාවේ සහ බෝනියෝහි වැඩබිම් /සංරක්ෂිතඃ පොරුන්තාල්, පුලන්කුරුඩි, පරම්බුකන්මා සහ අක්කරම්පතම් (දකුණු ඉන්දියාව), බටහිර සාට් (ඉන්දියාව) සහ ලෝගාන් බර්න්ට්, සරවක්, මැලේසියානු බෝර්නියෝ.

6. ඉලක්ක / අරමුණු ඃ

මාගේ වර්තමාන පර්යේෂණයෙහි මූලික ඉලක්ක වනුයේ පශ්චිම චාතුර්ථික දේශගුණික සහ පාරිසරික වෙනස්වීම් (උදා ඃ දිගුකාලීන සහ කෙටිකාලීන දේශගුණික වෙනස්වීම්, ඉහළ කඳුකර සහ පහත්බිම් වැසි වනාන්තරවල ගති ස්වභාව, වැසි වනාන්තර පරිසර කෙරෙහි මානව බලපෑම්, මුහුදු මට්ටම වෙනස්වීමේ බලපෑම ප්‍රතිසංස්කරණය කිරීම සහ ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයෙහි 'ගෘහස්ථ සහල්' / සහ අංගයන්ගේ විකාසනයයි. යුරෝපය, නිරිත දිග ආසියාව, ගිනිකොණ දිග ආසියාව සහ ආසියාවෙහි 'පූර්ව නව්‍යශිලා' යනු දඩයම් / පශු මූලික ආර්ථිකයන් (විවිධාකාර යාන්ත්‍රණ ඔස්සේ) ධාන්‍යමය බෝග (තිරිඟු, බාර්ලි, ඕට්ස්, මිලට් සහ සහල්) සහ 'ගෘහස්ථ' සතුන් (ගවයන්, බැටළුවන් / එළුවන්, ඌරන්) සහිත 'ගෘහස්ත වූ' කුඩා පැකේජයන් ගොවිතැන පදනම් කරගත් ආර්ථිකයන් විසින් ප්‍රතිස්ථාපනය වූ විද්වතුන් ගණනාවකගේ ප්‍රශ්න කිරීම් වලට විශාල වශයෙන් ලක් වූ කාලයයි. මෙය වඩාත්ම සිත් ගන්නා ගෝලීය කරුණු වලින් එකක් වන අතර ශ්‍රී ලංකාවේ ඇතැම් වැදගත් පුරා විද්‍යාත්මක සහ පුරා පාරිසරික බිම් වලට (උදා ඃ පාහියන් ගල් ගුහාව සහ හෝටන් තැන්න) මානව ඉතිහාසයේ ඉතාම වැදගත් කරුණු අතරින් එකක් වශයෙන් කෘෂිකර්මාන්තයේ මූලාරම්භයන් පරීක්ෂා කිරීමට විභවයක් ඇතිබව පෙනේ. මෙම අරමුණු සඳහා පුළුල් භූගෝල විද්‍යාත්මක සන්දර්භයක් තුළ පර්යේෂණ ක්‍රියාමාර්ග ගණනාවක ශක්තිමත් දත්ත කුලකයන් ගොඩනැගීම අවශ්‍ය වේ. එබැවින් වර්තමාන පර්යේෂණයෙහි අවසන් අරමුණ වන්නේ ගෝලීය වෙනස්වීම් වැඩ සටහන්වල (උදා ඃ IPPCඃ දේශගුණික වෙනස්වීම් පිළිබඳ අන්තර් රාජ්‍ය සභාව, PAGESඃ අතීත ගෝලීය වෙනස්වීම්, INQUAඃ චාතුර්ථක විද්‍යාව පිළිබඳ අන්තර්ජාතික සංගමය සහ IGBPඃ අන්තර් ජාතික භූගෝල සහ ජෛවගෝල වැඩසටහන) ඉතාම වැදගත් කරුණු වශයෙන් කලාපීය (දකුණු සහ ගිනිකොණ දිග ආසියාව) දේශගුණික සහ පාරිසරික සහ සම්බන්ධතා වැඩි දියුණු කිරීමයි. ඊට අමතරව, අරමුදලෙහි මැදිහත්වීමකින් තොරව කළ නොහැකි අධ්‍යයනයන් කරගෙන යාමට ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ විශ්ව විද්‍යාලයන්හි පශ්චාත් උපාධි මට්ටමේ තරුණ ශිෂ්‍යයන් සඳහා අවස්ථාවන් සපයා දීම මගින් ශ්‍රී ලංකාවේ චාතුර්ථක දේශගුණික සහ පාරිසරික වෙනස්වීම වටහා ගැනීමේ ධාරිතාවය ගොඩනැගීම වර්තමාන පර්යේෂණයේ අරමුණයි. වර්තමානයේ දී, පර්යේෂණ ක්‍රියාකාරකම්වලට භූගෝල විද්‍යාව, පුරා පාරිසරික විද්‍යාව, පුරා විද්‍යාව පිළිබඳ විද්‍යායතනය, ක්වීන්ස් විශ්ව විද්‍යාලය, එක්සත් රාජධානිය, පුරා විද්‍යා දෙපාර්තමේන්තුව, ලුන්ඩ් විශ්ව විද්‍යාලය, ස්වීඩනය, පුරා විද්‍යාත්මක මැනුම් දෙපාර්තමේන්තුව සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, පේරාදෙණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව සහාය දක්වයි. තවද, මම මාගේ පර්යේෂණ ක්‍රියාකාරකම් ස්ථාපිත සහයෝගිතාවය සමග නොකඩවා කරගෙන යාමට සහ පසුගිය වසර 50 දහස පුරා පාරිසරික නියමු සහ පමාවන් සහ INTIMATEgroup/PAGES/INQUA හි කොටසක් ලෙස IFG ශෝධනය කරමින් CELL 50K සමග නව සම්බන්ධතාවයක් ලබාගැනීමට පිවිසීමට බලාපොරොත්තුවෙන් සිටිමි. ව්‍යාපෘතීන්හි ප්‍රධාන කාර්යයන් වනුයේ පුරා පාරිසරික සහ පුරා විද්‍යාත්මක බිම් වෙතින් වන විස්තරාත්මක අධි විභේදන විකිරණශීලී කාබන් දිනැති ලිනෝ සහ ජෛව ස්ථර වින්‍යාස ඉදි කිරීම හා අර්ථ නිරූපණය වේ. මෙම ස්ථර වින්‍යාසනයන්හි නිරාපතිත කාබන්, වැඩි / අඩු සංඛ්‍යාත චුම්බකීය නම්‍යතා, පරාග (පරාග, බීජාණු, ඩයනොෆලැගලෙ, ෆොරාමිනිෆෙරා, ඇල්ගී, ක්ෂුද්‍ර අංගාර, තාපමය වැඩීම්, VAM දිලීර, පාසි ක්ෂුද්‍ර පොසිල, සිලිකාමය ක්ෂුද්‍ර පොසිල (ශාක සිලිකා සහ ඩයටම) අඩංගු වේ. මෙම ක්‍රියාවලීන් තුළ පුරා විද්‍යාත්මක සහ පුරා පාරිසරික බිම් වල පරාග සහ ශාක සිලිකා භාවක්ෂය විමර්ශනයද අඩංගු වේ.

## 7. පර්යේෂණ උන්නතීන්

අන්තර්ජාතික ඉහළ බලපෑම් වාරසඟරා ප්‍රකාශනය

ප්‍රේමතිලක, ආර්. 2011. ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රදේශයේ හෝටන් තැන්නේ මිනිස් භාවිතයට ගනු ලබන ඉහළ කඳුකර පරිසර පද්ධතිය- පශ්චාත්-ග්ලැසියර සහ මුල් කාලීන හොලෝසීන යුගයේ දේශගුණයේ සහ පාරිසරික වෙනස්කම්වලට සම්බන්ධතාවය.

චාතුර්ථක විද්‍යා සමාලෝචනය 50, 23-42

කටයුතු කෙරෙමින් පවතින:

ප්‍රේමතිලක, ආර්. 2010-2011. ක්‍රි.පූ. 420 සහ ක්‍රි. ව. 20 අතරතුර ශ්‍රී ලංකාවේ මල් සහ මෘත ශරීරාගාර චාරිත්‍ර. පුරාවිද්‍යා වාර සඟරාව (පිළිගත්)

හන්ට්, සී. ඕ., ප්‍රේමතිලක, ආර්., රබට්, ආර්., 2011-2011. අග්නිදිග ආසියාවේ සහ ඔස්ට්‍රේලේසියාවේ නව්‍ය පාෂාණ පිළිබඳ සංකල්පය: ඇගයීමක්. පුරාවිද්‍යා වාර සඟරාව (පිළිගත්)

ප්‍රේමතිලක, ආර්. සහ හන්ට්, සී.ඕ., 2011-2011. ශ්‍රී ලංකාවේ පාහියන් ගල් ගුහාවල පශ්චාත් ප්ලයිස්ටොසීන අනුක්‍රමයේ සිට ශාක සිලිකාමය ගවේෂණය. පුරාවිද්‍යා වාර සඟරාව (පිළිගත්)

ප්‍රේමතිලක, ආර්. ශ්‍රීනිවාසන්, පී., ක්‍රිෂ්ණමූර්ති, ඒ., රන්ජන්, කේ., කුමාර්, වයි. වයි. පී., (2011-2011). දකුණු ඉන්දියාවේ මුල් කාලීන යකඩ යුගයේ භූ ලක්ෂණ සහ මානව ක්‍රියාකාරකම් ඇගයීම: මහා ශිලා සුසාන භූමියේ ශාක විද්‍යා සහ පුරාවිද්‍යාත්මක අධ්‍යයනය (සංස්කරණය කරමින් පවතී.)

8. අන්තර්ජාතික සම්මන්ත්‍රණ, රැස්වීම් සහ සාකච්ඡා: ප්‍රකාශයට පත් කළ කෘත්‍ය සහ පෝස්ටරය ඉදිරිපත් කිරීම.

ලබා ගත හැකි පුරාපරිසරවිද්‍යාත්මක දත්ත: ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ පෝලියෝලිතික-පාරිසරික පර්යේෂණය පිළිබඳ වාචික ඉදිරිපත් කිරීම. අන්තර්ජාතික භූ-ගෝලීය සහ ජෛව-ගෝලීය වැඩසටහන, 2011 ජනවාරි 27-29 දක්වා වැඩමුළුව, මෝසම් වර්ෂාවෙන් බලපෑමට පත් ලෝකයේ භූමි ආවරණය ප්‍රතිසංස්කරණය- පරාග ආකෘති ප්‍රවේශය සහ දත්ත සංයෝගය, පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය, ඉන්දියාව, 2011

'ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රදේශයේ හෝටන් කඳුකරයේ පශ්චාත් චාතුර්ය අතරතුර දී කඳුකර වැසි වනාන්තර වෙනස්කම්: බහු-ප්‍රතියුක්ත නියැලුම්. 'ඉන්දියාවේ පොන්ඩිචෙරි විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා වූ කාන්චිමමුනිවාර් මධ්‍යස්ථානයේ ශාක විද්‍යා දෙපාර්තමේන්තුවේ 'දේශගුණය වෙනස්වීමේ සහ ජෛවවිවිධත්වයේ බලපෑම' පිළිබඳ ජාතික සම්මන්ත්‍රණය, 2011.

'ශ්‍රී ලංකාවේ සහ දකුණු ඉන්දියාවේ පුරාපරිසරවිද්‍යාත්මක සහ පුරාවිද්‍යාත්මක සන්දර්භය තුළ ශාක සිලිකා නියැලුම' පිළිබඳ වාචික ඉදිරිපත් කිරීම/ සාකච්ඡාව. පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනයේ පිළිබඳ මාසික සම්මන්ත්‍රණ මාලාවේ දී, ඉන්දියාව, 2011.

'ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රදේශයේ හෝටන් තැනිතලාවල පුරාණ කාලගුණය සහ පාරිසරික වෙනස්කම් පිළිබඳ පෝස්ටර ඉදිරිපත් කිරීම/ සාකච්ඡාව. අන්තර්ජාතික භූ-ගෝලීය සහ ජෛව-ගෝලීය වැඩසටහන (IGBP, PAGES&, 2011 ජනවාරි 27-29 දක්වා වූ වැඩමුළුව, මෝසම් වර්ෂාවෙන් බලපෑමට පත් ලෝකයේ භූමි ආවරණය ප්‍රතිසංස්කරණය- පරාග ආකෘති ප්‍රවේශය සහ දත්ත සංයෝගය, පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය, ඉන්දියාව, 2011.

පොරුන්තාල් හි ශාක සිලිකා අධ්‍යයනයේ පුරාවිද්‍යාත්මක අනුමිතීන් පිළිබඳ පෝස්ටර ඉදිරිපත් කිරීම/ සාකච්ඡාව (එනම් ඉන්දියාවේ බටහිර සාට් ආසන්න මහා ශිලා භූමදාන භූමිය). අන්තර්ජාතික භූ-ගෝලීය සහ ජෛව-ගෝලීය වැඩසටහන (IGBP, PAGES) යටතේ පොන්ඩිචෙරි විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා සහ ඉතිහාසය දෙපාර්තමේන්තුව සහ පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය ඒකාබද්ධව. 2011 ජනවාරි 27-29 දක්වා වූ වැඩමුළුව. මෝසම් වර්ෂාවෙන් බලපෑමට පත් ලෝකයේ භූමි ආවරණය ප්‍රතිසංස්කරණය- පරාග ආකෘති ප්‍රවේශය සහ දත්ත සංයෝගය, පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය, ඉන්දියාව, 2011.

ගිනිකොණදිග ආසියාවේ බෝර්නියෝහි සහල් වගාවේ පුරාපරිසරවිද්‍යාව සහ මුහුණුවර පිළිබඳ පෝස්ටර ඉදිරිපත් කිරීම/ සාකච්ඡාව: අන්තර්ජාතික භූ-ගෝලීය සහ ජෛව-ගෝලීය වැඩසටන (IGBP, PAGES) 2011 ජනවාරි 27-29 දක්වා වූ වැඩමුළුව. මෝසම් වර්ෂාවෙන් බලපෑමට පත් ලෝකයේ භූමි ආවරණය ප්‍රතිසංස්කරණය- පරාග ආකෘති ප්‍රවේශය සහ දත්ත සංයෝගය, පොන්ඩිචෙරි ප්‍රංශ ආයතනය, ඉන්දියාව, 2011.

'ශ්‍රී ලංකාවේ මධ්‍යම ප්‍රදේශයේ හෝටන් කඳුකරයේ පශ්චාත් ප්ලයිස්ටොසීන සහ මුල් කාලීන හොලෝසීන කාලගුණය සහ පාරිසරික වෙනස්කම්. චාතුර්ථක විද්‍යාව සඳහා අන්තර්ජාතික සංගමය, කොන්ග්‍රසය- 2011 ජුලි මස 20-28, බර්න් නගරය, ස්විට්සර්ලන්තය, 2011.

බෝර්නියෝ වේ 'නවශිලා': වෙනස් ආකෘතියක්. චාතුර්ය විද්‍යාව සඳහා අන්තර්ජාතික සංගමය, කොන්ග්‍රසය- 2011 ජුලි මස 20-28, බර්න් නගරය, ස්විට්සර්ලන්තය, 2011. (සී. එච්. හන්ට්, ආර්. ප්‍රේමතිලක සහ එස්. ජෝන්ස් යන අයගේ හවුල් ඉදිරිපත් කිරීම. 2011.

9. PAL-LAB, PGIAR සහ QUBවල සිදු කරමින් පවතින කෘත්‍යයන් ( පර්යේෂණ කටයුතු සිදු කරමින් පවතී.)

හන්ට්, සී. ඕ. සහ ප්‍රේමතිලක, ආර්. 2010-2011. මැලේසියානු බෝර්නියෝ හි , සරවක්, ලෝගන්බුනට් සිට මුල් කාලීන හොලෝසීන වගාවන් සහ දේශගුණික වෙනස්කම් පිළිබඳ ඉතිහාසය. පුරාපරිසරවිද්‍යාව, පුරාභූගෝලවිද්‍යාව, පුරාදේශගුණවිද්‍යාව (රසායනාගාර පරීක්ෂණ යටතේ)

හන්ට්, සී. ඕ. සහ ප්‍රේමතිලක, ආර්. 2010-2011. බෝර්නියෝ හි මුල් කාලීන හොලෝසීන් කැලෑ සහ වගා කළ සහල්. පුරාවිද්‍යා වාර සඟරාව (රසායනාගාර පරීක්ෂණ යටතේ)

ප්‍රේමතිලක, ආර්. 2010-2011. ගිනිකොණදිග ආසියාවේ මැලේසියාවේ බෝර්නියෝ හි කැලෑ සහල්වල ශාක සිලිකා රූප වර්ග (රසායනාගාර පරීක්ෂණ යටතේ)

10. බාහිර දේශන

කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයෙහි දේශන (පැය 10) සහ ප්‍රායෝගික පන්ති (පැය 5) ගණනාවක් පැවැත්වීමට මා හට ආරාධනා ලැබී ඇත. මෙම වැඩසටහන ජීව විද්‍යාත්මක විද්‍යාව සහ මානව විද්‍යාව හදාරා ඇති උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් මත පදනම් වේ. **සටහන** : මෙම සියලු ක්‍රියාකාරකම් කිසිදු ගෙවීමක් ලබාගැනීමෙන් තොරව අවසන් කෙරිණි.

11. අනෙකුත් වැඩ සඳහා සහාය

ශ්‍රී ලංකාවේ පුරා විද්‍යාත්මක මැනුම් දෙපාර්තමේන්තුව විසින් කරගෙන යනු ලබන ව්‍යාපෘතියක් සඳහා මාගේ විශේෂඥතාවය ලබා දෙන ලෙස මාගෙන් විමසනු ලැබීය. මෙම ව්‍යාපෘතිය ඓතිහාසික දැව ස්මාරක පිළිබඳ සංවාදයෙහි ඇතැම් පැතිකඩ මත පදනම් විය. මාගේ දායකත්වය වූයේ සංරක්ෂණ අරමුණු සඳහා ක්‍රියාමාර්ග ගැනීමේදී අවශ්‍ය වන බිම් මට්ටමේ වාර්තාවක් සැකසීම සඳහා පාරිසරික දත්ත (දව ස්මාරක හා සම්බන්ධ ආර්ද්‍රතාවය සහ ආලෝක තත්වවල වෙනස්වීම්) එක්රැස් කිරීමේ ක්‍රමවේදාත්මක බල කිරීම සහ දත්ත කළමනාකරණය සැපයීමය. මෙම ව්‍යාපෘතියෙහි සහකරු වූයේ පුරා විද්‍යාත්මක මැනුම් දෙපාර්තමේන්තුවේ කුමාරි දිසානායක මහත්මියයි. එක්සත් රාජධානියේ ඔක්ස්ෆෝඩ් විශ්ව විද්‍යාලයේ භූගෝල විද්‍යා සහ පරිසර විද්‍යායතනය විසින් සිදු කළ 'ඉන්දියාවේ බටහිර ඝාට්හි මානව කළමනාකරණය සහ භූ දර්ශන උරුමයන්' ව්‍යාපෘතිය සඳහා මම උපදේශකවරයෙකු වශයෙන් මම ක්‍රියා කළෙමි. හෝටන් තැන්න අපගේ ලෝක උරුමයන්ගෙන් එකක් වශයෙන් නම් කිරීම සඳහා වූ

පර්යේෂණ තලයෙහි දී රැස්වීම් සහ සාකච්ඡා ඵලදායීව පැවැත්වීමටද මම මාගේ සේවය ශ්‍රී ලංකාවේ පරිසර අමාත්‍යාංශය වෙත ලබා දුනිමි.

12. මහජනතාව සහ ජන මාධ්‍ය ආවරණය සමඟ දැනුම බෙදා ගැනීමේ අත්දැකීම්

ශාකසිලිකාවල නියැලුම පිළිබඳ මහජන දේශනය. මැඩ්‍රාස් ක්‍රිස්තියානි විද්‍යාලයේ පශ්චාත් උපාධි මධ්‍යස්ථානය, ඉන්දියාව, 2011 ජනවාරි 24.

ශ්‍රී ලංකාවේ පශ්චාත් චාතුර්ය අවධියේ දී (පසුගිය වසර 25,000 දී) වැසි වනාන්තරවල සිදු වූ වෙනස්කම් පිළිබඳ මහජන දේශනය. මැඩ්‍රාස් ක්‍රිස්තියානි විද්‍යාලයේ පශ්චාත් උපාධි මධ්‍යස්ථානය, ඉන්දියාව, 2011 ජනවාරි 25.

ශ්‍රී ලංකාවේ දේශගුණික වෙනස්කම් සහ වාණිජ වගාවන් පිළිබඳ මහජන දේශනය. වාර්ෂික පුහුණු වැඩසටහනේ දී, ඇට්කන් ස්පෙන්ස් (පෞද්ගලික) සමාගමේ අනුග්‍රාහකත්වය මත, කොළඹ, ශ්‍රී ලංකාව, 2011 16වැනි සඳුදා.

**13.** PGIAR හි චර්යානුගත වැඩ

මම පාරිසරික පුරාවිද්‍යාව සඳහා ප්‍රධාන කථිකාචාර්ය ලෙස කටයුතු කළෙමි. එයට අමතරව PGIAR හි ඩිප්ලෝමා සහ උසස් උපාධි ශිෂ්‍යයන් සඳහා සකස් කළ විභාග වැඩ අධීක්ෂණය කාල සටහන් වලට අනුකූලව නිම කෙරිණි. එක් උසස් උපාධි ශිෂ්‍යයෙකුගේ නිබන්ධනය (විද්‍යාපති) අධීක්ෂණය කළ අතර ඩිපලෝමා ඇගයීම් (35 ක් පමණ) සම්පූර්ණ කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මග පෙන්වීම සපයා දෙන ලදී. මම PGIAR හි අධ්‍යයන සහායක වැඩවල යෙදී ඇත. උදා : පශ්චාත් උපාධි මට්ටමේ ශිෂ්‍යයන් හා සම්බන්ධ විෂය නිර්දේශ, භාවිතාවන්, ක්ෂේත්‍ර වැඩ, පාඩම්, විභාග කැඩ යාවත්කාලීන කිරීම. පශ්චාත් උපාධි මට්ටමේ ශිෂ්‍යයන් සඳහා අදාළ අධ්‍යයන වැඩ සිදු කර ඇත. (දේශන, CD සහ වෙනත් ඉදිරිපත් කිරීම් සකස් කිරීම). පාරිසරික පුරාවිද්‍යාව හා සම්බන්ධ කරුණු (උදා: ස්ථර වින්‍යාසාත්මක පැදීම්, ක්ෂේත්‍ර වැඩ, න්‍යෂ්ටි කළමනාකරණය, විද්‍යාගාර වැඩ) වැඩිදියුණු කිරීමට අවශ්‍ය ප්‍රායෝගික වැඩ PGIAR හි දී සම්පූර්ණ කර ඇත. 2011 වර්ෂය සඳහා PGIAR හි තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ද කටයුතු කරන ලෙස මාගෙන් ඉල්ලා ඇත. මවිසින් මාගේ ක්ෂේත්‍ර වැඩ, වර්තමාන පර්යේෂණ සිදු කිරීමට හෝ මාගේ පර්යේෂණ සඳහා සහභාගි වීමට කිසිදු රාජ්‍ය / රජයේ / PGIAR අරමුදලක් භාවිතා කර නොමැති බව සටහන් කිරීම අවශ්‍ය වේ. නමුත්, සියලු ක්‍රියාකාරකම් ස්ථාපිත කොට ඇති ඍජු / වක්‍ර සහාය සහ සහයෝගිතාවය සමග මනාව කළමනාකරණය කෙරිණි. මවිසින් මාගේ පර්යේෂණ සොයා ගැනීම් / ලිපි වලදී කලාපීය / ගෝලීය පර්යේෂණ ගැටළු වලට අවධානය යොමු කරමින් අන්තර්ජාතික අවස්ථා ගණනාවකදී (උදා : IPPC, PAGES, INQUA, IGBP) සිදු කළද පුරා විද්‍යාත්මක විද්‍යා සඟරාව, චාතුර්ථක ජාත්‍යන්තරය, පුරා පාරිසරික විද්‍යාව, පුරා දේශගුණ විද්‍යාව, පුරා භූගෝල විද්‍යාව (P3) , ග්‍රැනා සහ චාතුර්ථක විද්‍යා සමාලෝචනය ආදී ලොව පුරා විශේෂී සඟරාවල මහත් වර්ධනයෙහි ලැදි බව අනුගමනය කරමින් මම මාගේ රාජකාරි PGIAR වෙත මනාව සිදු කරන ලද බව මාගේ හැඟීමයි.

## ආචාර්ය පී. විදානපතිරණ මිය

2011 ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළ තීරයේ මුල් කාලීනස හ මධ්‍ය කාලීන ඓතිහාසික වරාය නගර. කුලසේකර. කේ. ඒ. කරුණානන්ද සහ කොග්ගලගේ. ඩී. (සංස්කාරකවරු) මහාචාර්ය ඒ. ලියනගමගේ සිල්වා අනුස්මරණ වෙළුම, ගොඩගේ ප්‍රකාශනය, කොළඹ

2011අ අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඓතිහාසික කලාපීය ප්‍රදේශ ඒකක, එම්. අමරසිංහ (සංස්කාරක) අභය ආරියසිංහ අනුස්මරණ වෙළුම, එස්. ගොඩගේ ප්‍රකාශනය, කොළඹ

2011ආ ඓතිහාසික ශ්‍රී ලංකාවේ පොලොන්නරුවේ සහ නගරාසන්න ප්‍රදේශවල මාර්ග ජාලයේ අවකාශමය ව්‍යාප්තිය. නිපුණ ප්‍රකාශන (පෞද්) සමාගම. ශ්‍රී ලංකාව.

2011ඇ නිකවලමුල්ලේ මුල් කාලීන ඓතිහාසික භූමියේ භූගෝලීය පිහිටීම. ජේ. වීරසිංහ සහ ජී. අදිකාරී (සංස්කාරක) රුවන්වැල්ල මුල් කාලීන භූමිය, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය. කොළඹ.

2011ඈ ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ඓතිහාසික භූ ලක්ෂණ, ජේ. වීරසිංහ සහ ඩබ්ලිවු. බෝහින්ගමුව (සංස්කාරක) UNDP ප්‍රකාශනය.

2011ඉ ශ්‍රී ලංකාවේ දකුණු පළාතේ ඓතිහාසික මායිම්, ජේ. වීරසිංහ සහ ඩබ්ලිවු. බෝහින්ගමුව (සංස්කාරක) UNDP ප්‍රකාශනය.

සමාජ විද්‍යා පීඨ ප්‍රකාශනය, කැලණිය විශ්ව විද්‍යාලය-2011

## රංජිත් බණ්ඩාර මහතා - 2011

### 1. අධ්‍යයන කාර්යයන් වලට පරිබාහිරව ඉටු කරන ලද කාර්යයන්

1. i. ව්‍යාපෘති වැඩ

ක්ෂේත්‍ර සම-අධ්‍යක්ෂක,

රුවන්වැල්ල නිකවැලමුල්ල මැටි ඔරු සුසානභූමි නැවත ගොඩ ගැනීමේ කැණීම් ව්‍යාපෘතිය 2010-2011, පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනය.

**ii. ව්‍යාපෘති වැඩ**

ප්‍රධාන පර්යේෂක,

යාන් ඔය මධ්‍යම ද්‍රෝණිය මෘතශරීරාගාර පුරාවිද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘතිය 2011-2014 (YOMB) පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනය.

1වැනි අදියර- පුරාවිද්‍යාත්මක ගවේෂණය 2011 ජුලි සිට සැප්තැම්බර්

**YOMB ව්‍යාපෘතිය 2011-2014**

යාන් ඔය මධ්‍යම ද්‍රෝණිය පර්යේෂණ ව්‍යාපෘතියඃ සමාජ පන්ති ක්‍රමය සහ සමාජ අසමානතාවන්වල මතුවීම සෙවීම ඉලක්ක කර ගත් බහු-විෂයයන් මූලික පර්යේෂණ ව්‍යාපෘතියකි. ක්‍රි. පූ. පළමුවැනි සහශ්‍රවර්ෂය දක්වා දිවෙන ශ්‍රී ලංකාවේ මෙනම් මුල් කාලීන ඓතිහාසික කාලපරිච්ඡේදයේ දී ඉතිරි වී ඇතැයි පැවසෙන පුරාවිද්‍යාත්මක නෂ්ටාවශේෂවලින් නිරූපණය වන සමාජ පන්තිභේදය අධ්‍යයනය කිරීම ව්‍යාපෘතියේ සමස්ත අරමුණ වේ. එම මුල් කාලීන නෂ්ටාවශේෂ අයිති තැනැත්තන් පළමු ගොවීන් වන්නට විය හැකි බවට අනුමාන කරනු ලැබේ. මෙම අධ්‍යයනය තුලින් මුල් කාලීන කාලපරිච්ඡේදයට අයත් මෘතශරීරාගාරයක නටඹුන් සම්බන්ධව ද විශේෂයෙන්ම මෙම අවධියේ දී තිබූ මහා ශිලා භූමදාන කටයුතු සහ ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ පුරාවිද්‍යාත්මක භූමියක් වන යාන් ඔය ගංගා ද්‍රෝණියේ

ඒවායේ පිහිටීම පිළිබඳව අවධානය යොමු කරයි. එමෙන්ම වැඩමුළු සහ සම්මන්ත්‍රණ පැවැත්වීම සහ කල් පවතින මෘතශරීරාගාර පුරාවිද්‍යාත්මක පර්යේෂණ පරිසරයක් ගොඩනැගීම ද සිදු වේ.

**iiii. ව්‍යාපෘති වැඩ**

ක්ෂේත්‍ර අධ්‍යක්ෂක,

යාපහුව ඓතිහාසික භූමියේ අනුරූපණ ව්‍යාපෘතිය 2011, පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනය.

2. අධ්‍යක්ෂවරයාගේ/ PGIAR පූර්ව අනුමැතිය යටතේ වෙනත් ආයතනවල සිදු කරන ලද කාර්යයන්

2.1 ක්ෂේත්‍ර වැඩ

2.1.i. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත් වන ලද 2010-2011 නිකවැලමුල්ල භූ ඔරු සුසානභූමි මුදාගැනීමේ කැණීම් කටයුතු ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර කටයුතුවල සම-සම්බන්ධීකරකයෙක් ලෙස සහභාගීවිය.
2.2. i. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් රුවන්වැල්ල, නිකවැලමුල්ල පවත් වන ලද 2010 විද්‍යාපති උපාධිය සඳහා වූ ක්ෂේත්‍ර පාසලේ ගුරුවරියක් ලෙස සහභාගීවීම.

2.4 ඉගැන්වීම්

2.4.i. සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ පිඟන් මැටි දෙපාර්තමේන්තුවේ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස පත්වීම.

2.4.ii. කැළණිය විශ්ව විද්‍යාලයේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ බාහිර කථිකාචාර්යවරයෙක් ලෙස පත්වීම.

**3. ප්‍රකාශන**

3.1 ප්‍රකාශන (අන්තර්ජාතික) - ' වැව් ආශ්‍රිත ගම්මානවල වැසියන් විසින් ගම්බිම් හැරයාමේ හැසිරීමඃ ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වැව්-ගම්මාන පිළිබඳ දරාගැනීමේ ධාරිතාවේ ප්‍රතිඵල, 3වැනි ශ්‍රී ලංකා අන්තර්ජාතික කොන්ග්‍රසයේ දී මංගල කටුගම්පොල, තිලක් ගාමිණී ප්‍රියන්ත, අමල්ක විජේසූරි සහ පූජ්‍ය ඒ. චන්දිම යන අය සමඟ සම-කතෘ ලෙස දායක වෙමින් දකුණු ආසියාතික පුරාවිද්‍යා සංගමයේ සංක්ෂිප්ත වෙළුමට දායක කරන ලද ලිපියකි,

**5. දැනුම බෙදා හැරීම**

5.1. පුරාවිද්‍යා කෞතුකාගාරයේ දී මහජනයා වෙනුවෙන් පවත්වන ලද 'ශ්‍රී ලංකාවේ ඓතිහාසික මෘතශරීරාගාර පරිචයන්' යන මැයෙන් යුත් මහජන දේශකය, CCF හි පොලොන්නරුව දිස්ත්‍රික්කයේ අලහන පිරිවෙන ව්‍යාපෘතිය මගින් සංවිධානය කරන ලදී.

## **6.** **වර්තමාන පර්යේෂණ**

6.i. සමාජ පන්තිකරණයේ මූලාරම්භයන් සඳහා මධ්‍යම යාන් ඔය ද්‍රෝණියේ පර්යේෂණ ව්‍යාපෘතියක් ලෙස පර්යේෂණ ව්‍යාපෘතියක් සකස් කිරීම.

6.ii. ආචාර්ය උපාධිය

මෘතශරීරාගාර
ජන මානවවිද්‍යාත්මක
පිළිබඳව ලියැවුනු
ආචාර්ය උපාධි
අඩංගු කරන ලදී.

| | | | |
|---|---|---|---|
| **2011** | පෙබ 18– පෙබ 20 | අංක 9 | රතුගල |

සඳහා ඉගෙනීම

පුරාවිද්‍යාව සහ
පුරාවිද්‍යාව
ග්‍රන්ථ මාගේ
අධ්‍යයනය සඳහා

## ඩී. පී. ගමලත් - කථිකාචාර්ය

- කරන ලද පර්යේෂණ

බුද්ධ රූප තිබූ නිවාස පිහිටි සත්‍ය කාලය සනාථ කිරීම සඳහා පුරාවිද්‍යාත්මක දත්ත තවදුරටත් එක්රැස් කිරීම සඳහා තේවැල්ල, දෙවුරම්වෙහෙර, දෙවුරම්වෙහෙර සහ මකුලෑව යන ප්‍රදේශවල කැණීම් කටයුතු කිරීම.

**ආචාර්ය ඩබ්. එස්. වැලිඅංග ඔහතා**

2010 ජුලි - 2011 ජුලි

**1. <u>සිදු කරන ලද පර්යේෂණ</u>**

1.1.වැද්දා ව්‍යාපෘතිය
රතුගලට ක්ෂේත්‍ර චාරිකා පහක් (දින සඳහා 1වැනි වගුව බලන්න.) සිදු කරන ලදී. වැදි ජනතාව සමග දින 25ක් පමණ වනාන්තරයේ ගත කළ අතර වැදි ජනතාවගේ සම්පත් උපයෝගීතාව පිළිබඳව තොරතුරු එක්රැස් කරන ලදී. ගල් ගුහා 15ක් පමණ සිතියම්ගත කරන ලදී.

1.2.ශ්‍රී ලංකාවේ ගුහා විද්‍යාව

ක්ෂේත්‍ර චාරිකා හතරක් සිදු කරන ලද අතර ගුහා නමයක් විද්‍යාත්මකව පරීක්ෂණ කරන ලදී (2වැනි වගුව බලන්න.)

**වගුව 2.**

| | |
|---|---|
| **2011** | අලවල උමං ගුහාව සහ ශාඛා, ගඟ එපිට = දෙවියන්පැන්න ගල ගුහාව, වරණ රජමහා විහාරයෙහි ගුහා, කොස්කඳවල රජමහා විහාරයෙහි ගුහා, පිළිකුත්තුව රජමහා විහාරයෙහි ගුහා, මා ලෙන, කරන්නාගොඩ රජමහා විහාරයෙහි ගුහා |

සාරාංශ

1. වැලිඅංග ඩබ්ලිවු. එස්., ඇල්ගිරිය, පී., දන්දෙණිය, ඒ. එස්., අලහකෝන්, ඒ. එම්. ඩී. සහ ඩී. දේවගේ. 2011. වැද්දන්ගේ වාර්ගික- පක්ෂි විද්‍යාවඃ ශ්‍රී ලංකාවේ වන්නායෙලා ඇත්තෝ. 12වැනි වාර්ෂික පර්යේෂණ පරිසංවාදය, කැළණිය විශ්වවිද්‍යාලය, 2011 නොවැම්බර් 3-4, 182 පිටුව.

2. ඇල්ගිරිය, පී., දන්දෙණිය, ඒ. එස්. , අලහකෝන් ඒ. එම්. ඩී. සහ ඩබ්ලිවු. එස්. වැලිඅංග. ශ්‍රී ලංකාවේ වාකරේ ප්‍රදේශයේ සිටින වෙරළබඩ වැද්දන්ගේ වර්තමාන තත්ත්වය. 2011. 12වැනි වාර්ෂික පර්යේෂණ පරිසංවාදය, කැළණිය විශ්වවිද්‍යාලය, 2011 නොවැම්බර් 3-4, xxx182 පිටුව.

3. ඇල්ගිරිය, පී., දන්දෙණිය, ඒ. එස්. , අලහකෝන් ඒ. එම්. ඩී. සහ ඩබ්ලිවු. එස්. වැලිඅංග. 2011. ශ්‍රී ලංකාවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ වාකරේ ප්‍රදේශයේ යකඩ උණු කිරීමේ භූමියක් සොයා ගැනීම. 12වැනි වාර්ෂික පර්යේෂණ පරිසංවාදය, කැළණිය විශ්වවිද්‍යාලය, 2011 නොවැම්බර් 3-4, 8 පිටුව.

4. පද්මකුමාර ජයසිංහ, දණ්දෙනිය, ඒ. එස්., සමන් සේනානායක, මහේෂ් චම්පික, ඩබ්ලිවු. ජී. දේවක, ආර්. සහ ඩබ්ලිවු. එස්. වැලිඅංග. 2011. මා-ලෙන, ශ්‍රී ලංකාවේ කිරිගරුඬ ගුහාව. 12වැනි වාර්ෂික පර්යේෂණ පරිසංවාදය, කැළණිය විශ්වවිද්‍යාලය, 2011 නොවැම්බර් 3-4, කැළණිය විශ්වවිද්‍යාලය, 73 පිටුව, පොස්ටර ඉදිරිපත් කිරීම.

## 2. ප්‍රකාශන

ග්‍රන්ථ පරිච්ඡේද

1. වැලිඅංග ඩබ්ලිවු. එස්. සහ ආර්. ඒ. එල්. ඔස්බෝන්. 2012. ශ්‍රී ලංකාවේ ගුහා සංරක්ෂණයේ සහ කළමනාකරණයේ ජෛවවිද්‍යාත්මක පැතිකඩ කීපයක්. 209-229 පිටු. රාජ සෝමදේව (සංස්කරණය). ශ්‍රී ලංකාවේ ගල්ගුහා චිත්‍ර සහ කැටයම් භූමි. PGIAR ප්‍රකාශනය. 236 පිටුව.

2011 වසර තුළ ඉදිරිපත් කරන ලද ලිපි

1. ඔස්බෝන්, ආර්. ඒ. එල්., වැලිඅංග, ඩබ්ලිවු. එස්. ජයසිංහ පද්මකුමාර, දණ්දෙනිය, ඒ. එස්., සහ පොග්සන්, ආර්. ඊ., දකුණු සහ මධ්‍යම ශ්‍රී ලංකාවේ ඇති ගුහා සහ ක්වාට්ස් වැනි ලක්ෂණ සහිත ප්‍රොටීරොසොයික් නයිස් පාෂාණ සහ කැම්බ්‍රියන් කළු ගල්. *Acta Carsologica* වෙත ඉදිරිපත් කරන ලදී.

   උපාලි එස්. අමරසිංහ, ජැකෝබස් විජ්වේබර්ග්, වසන්ත එස්. වැලිඅංග සහ මැතිස්වෝස්. සර්ම කලාපීය මත්ස්‍ය ගහණවල ආහාර ජාල රටාවන් සහ විවිධත්වය. *Lakes and reservoirs*වෙත ඉදිරිපත් කරන ලදී.

ඉදිරිපත් කිරීම්වල අත්පිටපත්

1. වැලිඅංග ඩබ්ලිවු. එස්. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික කාලයේ දී ක්ෂීරපාන් දඩයම් කිරීමේ අවකාශය සහ කාලය.

2. වැලිඅංග ඩබ්ලිවු. එස්. දණ්දෙනිය, ඒ. එස්. සහ පී. ඇල්ගිරිය. අතීතයට ගමනක්, 21වැනි සියවසේ වැන්නියෙලැ ඇත්තෝ (වැද්දන්) සමඟ ප්‍රාග් ඓතිහාසික මිනිසා සොයා ගැනීම.

3. වැලිඅංග ඩබ්ලිවු. එස්. ජයසිංහපද්මකුමාර, දන්දෙණිය, ඒ. එස්. සහ පී. ඇල්ගිරිය. ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රාග් ඓතිහාසික ගුහාවල ගුහා විද්‍යාව.

ප්‍රසිද්ධ මාධ්‍ය

ජාතික පුවත්පත්වල පළ වූ ලිපි "ද ඬේලි නිවුස්"

1. ජර්නි ඉන් ටු ද ඩාක්. 2011 ජනවාරි 24
2. ලයික් ද ෆ්ලෝවින් රිවර්. 2011 පෙබ. 25
3. වැන්ඩලයිසින් ඊස්තටික් බියුටි. 2011 පෙබ. 25

**බාහිර කථිකාචාරයවරයෙක් ලෙස කටයුතු කිරීම**

| | |
|---|---|
| **අධ්‍යයන වර්ෂය 2010 දෙසැ. - 2011 දෙසැ.** | **අධ්‍යයන වර්ෂය 2010 සැප්. - 2011 සැප්** |
| උපාධිය- පාරිසරික ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය | පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය |

ඉගැන් වූ පාඨමාලාව- පාරිසරික ආර්ථික විද්‍යාව පැය 32 ජෛව පුරාවිද්‍යාව පැය 04

**<u>පුස්තකාල ප්‍රගති වාර්තාව 2011</u>**

1. **ග්‍රන්ථ -** ග්‍රන්ථ 71ක් වර්ගීකරණය කිරීම, සූචිගත කිරීම සහ එකතුවට එක් කිරීම කරන ලදී.
2. **වාර සඟරා** - වාර සඟරා 155ක් මෙම කාල පරිච්ඡේදය තුළ ලැබුනි.
3. **පත්‍රිකා** - පත්‍රිකා 20ක් එකතුවට එක් කරන ලදී.
4. **ප්‍රදාන** - (ආසන්න වශයෙන්) රු. 17,900ක් වටිනා පොත් සහ වාර සඟරා ලැබුනි.
5. **ප්‍රකාශන විකිණීම්** - ප්‍රකාශන විකිණීම මඟින් (ආසන්න වශයෙන්) 139,399ක් උපයා ගන්නා ලදී.
6. **පුස්තකාල භාවිතය** - වසර 2011 දී (ආසන්න වශයෙන්) 3600කට වැඩි පිරිසක් පුස්තකාලය භාවිතා කරන ලදී.

**GIS ඒකකය**

**2011 ජනවාරි සිට 2011 දෙසැම්බර් දක්වා**

(i) 2011 ශ්‍රී ලංකාවේ ගල් ගුහා සිතුවම් සහ කැටයම් ව්‍යාපෘතිය සඳහා පහත දැක්වෙන සිතියම් නිර්මාණය කරන ලදී. (කටයුතු සිදු වෙමින් පවතී.)

(1) ශ්‍රී ලංකාවේ සිතියම්වල පාරිසරික විද්‍යාත්මක කලාප නිර්මාණය කරන ලදී.

(2) 'ශ්‍රී ලංකාවේ හඳුනාගත් ගල් ගුහා සිතුවම් සහ කැටයම් භූමි' බෙදා හැරීම.

(3) ශ්‍රී ලංකාවේ ගල් ගුහා සිතුවම් සහ කැටයම්වල ව්‍යාප්තිය සහ ප්‍රාග් ඓතිහාසික ප්‍රදේශ පෙන්වන සිතියම

(4) වර්තමාන ව්‍යාපෘතිය අතරතුර සංචාරය කරන ලද ගල් ගුහා සිතුවම් සහ කැටයම් පෙන්නුම් කරන සිතියමක්

(5) ගල් ගුහා සිතුවම් ඩිජිටල් තාක්ෂණ ආකාරයෙන් ඇඳීම.

(6) ඇඩෝබ් ඉලස්ට්‍රේටර් යොදා ගෙන සියලු ගල් ගුහා සිතුවම් ඇඳීම.

(ii) 2011 නිල්ගිරිසෑය ගවේෂණ ව්‍යාපෘතිය සඳහා පහත දැක්වෙන සිතියම් නිර්මාණය කරන ලදී.

(7) නිල්ගිරිසෑය ආරාමයේ භූමි සැලැස්ම

(8) අධ්‍යයන ප්‍රදේශයේ භූ-රූපණ පිහිටීම සහ ජාලක සිතියම්ගත කිරීම.

**(iii) වෙනත් කටයුතු (සිදු කරමින් පවතින)**

(9) උඩවලව ගවේෂණ සහ කැණීම් ප්‍රදේශ පෙන්වන සිතියම

(10) සීතාවක රාජධානිය පෙන්වන සිතියම සකස් කිරීම (ආචා. රෝස් සෝලංගාරච්චි මහත්මියගේ ඉල්ලීම පරිදි)

(11) ආරාම භූමිය ඇතුලත කුටි රූප (ආචාර්ය උපාධි සිතියම්- ගම්ලත් මහතා)

(12) ඉන්දියාව පෙන්වන සිතියම

(13) ශ්‍රී ලංකාවේ ආරාම සංකීර්ණ ව්‍යාප්තිය පෙන්වන සිතියමක් (ආචාර්ය උපාධි සිතියම්- ගම්ලත් මහතා)

2. පහත දැක්වෙන අංකිත් දත්ත සමුදායන් නිර්මාණය කරන ලදී.

(ii) විශේෂ සොයා ගැනීම් ලියාපදිංචිය සහ සමුද්ධරණ දත්ත සමුදාය, සීගිරිය ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල, 2011

3. පහත දැක්වෙන පෝස්ටර නිර්මාණය කරන ලදී.

(1) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ප්‍රදේශ සහ ස්මාරක ව්‍යාප්තිය

(2) ගාල්ල දිස්ත්‍රික්කයේ පුරාවිද්‍යාත්මක ප්‍රදේශ සහ ස්මාරක

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No: පීසී/එල්/පීජ්අයිඒආර්/එෆ්ඒ/2011
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Date: 2012 ඔක්තෝබර් 3 දින

අධ්‍යක්ෂ

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය

**කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ 20 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්ති සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාර විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උපවගන්තිය සහ 111 වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂකවරයා වෙත 2012 සැප්තැම්බර් 12 දින නිකුත් කරන ලදී.

## 1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

## විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ.තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීමද, ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

| විගණන විමසුම | පිළිතුරු |
|---|---|
| 2.2. <u>මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්.</u><br><br>2.2.1 <u>ගිණුම් ප්‍රතිපත්ති</u>·<br><br>ණයගැතියෝ, වියදම්, පරිත්‍යාග සහ ආදායම් ගිණුම් තැබීමේ ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි. | ආයතනයේ මූල්‍ය වාර්තාවලට අදාලවූ ගිණුම්කරණ ප්‍රතිපත්ති 2011 අවසාන ගිණුම්වල දක්වා තිබුනි. ඊට අතිරේකව දැක්විය යුතුයැයි සඳහන් මෙම ප්‍රතිපත්ති ඉදිරි වසරේ ගිණුම් තුලින් හෙළිදරව් කිරීමට සටහන් කර ගන්නා ලදී. |
| 2.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u><br><br>පහත සදහන් කරුණු නිරීක්ෂණය විය.<br><br>(අ) සරෙක් ව්‍යාපෘතිය අවසන්වීමෙන් පසු ව්‍යාපෘතියට අදාල බැංකු ගිණුම වසා තිබුණද එම ව්‍යාපෘතියට අදාලව වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තිබූ රු.5,155,572 ක මුදල නිරවුල්කර නොතිබුණි.<br><br>(ආ) සමාලෝචිත වර්ෂයට අදාලවූ වියදම් 2012 වර්ෂයට අදාල වියදම් ලෙස ගිණුම් ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම් රු.232,780 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | (අ) 2012 වර්ෂයේ අවසාන ගිණුම් තුලින් නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටි.<br><br>(ආ) ලිපිකරුමහතුන්ගේ හිගයත් නොවැලැක්විය හැකි කරුණු යෙදීමත් නිසා මෙම ප්‍රමාද දෝෂය සිදුවිය. 2012 වර්ෂයේදී මෙවැන්නක් ඇති නොවීමට උපරිම උත්සාහ ගන්නා අතර එය සටහන් කරගෙන ඇත. |

| | |
|---|---|
| (ඇ) එකතුව රු.687,244 ක්වූ අවුරුදු 01 කට වැඩි කාලයක් පවතින ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | (ඇ) මේ පිළිබඳව අදාල ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. එසේ නිදහස් කරනොගන්නා ශේෂ කළමනාකරණකරන මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසු ආයතනයට ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) පර්යේෂණ හා ප්‍රකාශන සඳහා ලැබී තිබූ ආමුදල් වලින් 2011 වර්ෂය අවසාන වන විටද වර්ෂයේ වියදම් ලෙස හඳුනා නොගත් වියදම් වෙනුවෙන්ද රු.523,000 ක් වෙනත් නිලධාරීන් තිදෙනෙකු නමින් උපචිත වියදම් ලෙස වෙන්කර තිබුණි. | (ඈ) රු. 523,000/-ක මෙම මුදල 2011 වර්ෂයට අදාල අභ්‍යන්තර පර්යේෂණ හා ප්‍රකාශන වියදම් ඇස්තුමේන්තු වලින් ඉතිරි වූ මුදල්ය. පර්යේෂණවලට අදාල වැඩ කොටස් 2011 වර්ෂය තුල අවසන් කරගැනීමට නොහැකිවීම නිසා 2012 වසරේ මුල් කාර්තුව තුල අදාල පර්යේෂණවල ඉතිරි වැඩ කොටස් නිම කරගැනීම සඳහා 2011 අවසාන ගිණුම්තුල ප්‍රතිපාදන වෙන් කිරීමකි. |
| (ඉ) ශේෂපත්‍රයේ ජංගම වත්කම් යටතේ තොග ගැලපුම් ගිණුම ලෙස රු.41,505 ක ශේෂයක් 2007 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි. | (ඉ)ප්‍රකාශන මුද්‍රණ වියදමකි. ඊට අදාල පොත් අස්ථානගත වී ඇත. විගණන කමිටුවට යොමුකර එම කමිටුවේ නිර්දේශය මත 2012 වර්ෂයේදී නිරවුල් කිරීමට තීරණය කර ඇත. |
| 2.3 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u><br>සමාලෝචිත වර්ෂයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් ක්‍රියාත්මක අභ්‍යන්තර පර්යේෂණ ව්‍යාපෘති වියදම් වශයෙන් රු. 3,911,015 ක් වැය කර ඇති අතර එක් එක් ව්‍යාපෘති වෙනුවෙන් තොරතුරු ඇතුලත් ලිපි ගොණු ලේඛණ හා ප්‍රගති වාර්තා ඉදිරිපත් නොවූ බැවින් එම වියදම් වල නිවැරදිතාවය සනාථ කරගත නොහැකි විය. | වියදම්වල නිරවද්‍යතාවය සනාථ කර ගතහැකි වනසේ විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි කටයුතු පහසුව සඳහා ඉදිරියේදී විධිමත් ආකාරයට සියළු තොරතුරු සහිත ලේඛන පිළියෙල කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. 2012 දෙසැම්බර් වනවිට එය නිවැරදි කර ඇත. |

2.4 <u>නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.</u>

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 371 මුදල් රෙගුලාසිය | කාර්යය නිමකළ විගස ලබාගත් අත්තිකාරම් පියවියයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 22කදී ලබාගත් මිශ්‍ර අත්තිකාරම් රු. 349,750 ක් ද අවස්ථා 10ක දී ලබාගත් පර්යේෂණ අත්තිකාරම් රු.758,980 ක්ද මාස 02 සිට මාස 05 දක්වා ප්‍රමාදවී පියවා තිබුණි. | (අ) බොහොමයක් අත්තිකාරම් අදල වනුයේ ආයතනයේ පර්යේෂණ කටයුතු සඳහාය. පර්යේෂණ කටයුතුවලට අදල නොවන ද වෙනුවෙන් වු අත්තිකාරම් මුදල් නියමිත කාලවකවානු තුල පියවීම් කර ඇති අතර විගණන විමසුමේ දක්වා ඇති ප්‍රමාදයන් ආයතනයට අයත් පර්යේෂණ කටයුතුවලට අදලව ලබාගත් අත්තිකාරම් මුදල් වේ. මෙයට හේතු වන්නේ පුරාවිද්‍යා පර්යේෂණ දිවයිනේ දුරබැහැර පළාත්වල එකදිගට මාස කිහිපයක් සිදුකිරීම හේතුවෙන් මෙවැනි ප්‍රමාදයන් නොවැලැක්විය හැකිව තිබේ. එහෙත් ලබාගත් සියලුම අත්තිකාරම් මුදල් විධිමත් පරිදි පියවා ගැනීමට කටයුතු කරනු ලබන අතර කාලප්‍රමාදයන් වලක්වා ගැනීමට හැකිතරම් දුරට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) අංක 95 හා 1994 ජුනි 14 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය | චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීණතා දීමනා ලෙස රු.70,242 ක් ගෙවා තිබුණි. | (ආ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කරන චක්‍රලේඛ හා විධිවිධානවලට අනුව කටයුතු කර ඇත. |
| (ඇ) අංක 45 හා 2011 අප්‍රේල් 07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛය | 2011 වර්ෂයේදී සිදුකරන ලද පර්යේෂණ පිළිබද වාර්තා 2011 දෙසැම්බර් 31 දිනට පෙර ආයතනයට ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 09 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා ලෙස ගෙවීම් කරන ලද රු.1,155,120 කට අදාල පර්යේෂණ වාර්තා ආයතනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | (ඇ) දැනට පහත සඳහන් පර්යේෂණ වාර්තා අධ්‍යයන කාර්‍යය මණ්ඩලයෙන් ලබාගෙන ඇත.<br>1. මහාචාර්ය රාජ් සෝමදේව මහතා<br>2. මහාචාර්ය ගාමිණී අදිකාරී මහතා<br>3. ආචාර්ය රෝස් සෝලංගආරච්චි මිය<br>4. ආචාර්ය අර්ජුන තන්තිලගේ මහතා<br>5. ආචාර්ය පී. විදානපතිරණ මිය<br>6. ඩී පී ගමලත් මහතා |

3. <u>මූල්‍ය සමාලෝචනය</u>

3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රථිඵලය රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 36,540,333 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.30,801,301 ක් විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 32,494,457ක ප්‍රදාන හේතු කොටගෙන එම ඌනතාවය රු.4,045,876 ක් දක්වා අඩුවී තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.33,639,960 ක ප්‍රදාන හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු.2,838,659 ක අතිරික්තයක් බවට පත්වී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට සාපෙක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,884,535 ක පිරිහීමක් සඳහා සේවක වැටුප් හා වේතන වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

4. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

4.1 <u>අධ්‍යයන කාර්ය සාධනය</u>

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2010/2011 අධ්‍යයන වර්ෂයේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා 02 ක්ද විද්‍යාපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා 01 බැගින්ද පවත්වා තිබූ අතර ලියාපදිංචි වී තිබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 106 ක් විය. පසුගිය අධ්‍යයන වර්ෂයේදී පවත්වා තිබූ උරුම අධ්‍යයනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබුණි.

(අ) ප්‍රමාණවත් සිසුන් පිරිසක් පාඨමාලාව හැදෑරීමට ඉල්ලුම් නොකිරීම නිසා මෙම පාඨමාලාව පැවැත්වීමට නොහැකි විය. මෙය අපට පාලනය කිරීමටද අපහසු තත්වයකි.

| | |
|---|---|
| (ආ) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 45 දෙනෙකු 2010/2011 අධ්‍යයන වර්ෂයේ දී ලියාපදිංචි වී තිබූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව 32.3% කින් එම පාඨමාලාව සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය වැඩි වී තිබුණද විද්‍යාපති (පුරාවිද්‍යා) පාඨමාලාව සඳහා සිසුන් 43 දෙනෙකු 2010/2011 අධ්‍යයන වර්ෂයේදී ලියාපදිංචිවී තිබූ අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව 8.5% කින් අඩුවී තිබුණි.<br><br>(ඇ) ඒක ශිෂ්‍ය පිරිවැය<br><br>2009/2010 අධ්‍යයන වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 346,418 ක් වූ අතර, 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා ඒක ශිෂ්‍ය පිරිවැය රු. 432,820 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේදී පසු ගිය වර්ෂයට සාපේක්ෂව ඒක ශිෂ්‍ය පිරිවැය 25% කින් වැඩි වී තිබුණි. | (ආ) ප්‍රමාණවත් ශිෂ්‍යයන් ලියාපදිංචි වීම වැලැක්විය නොහැකි තත්වයකි<br><br>(ඇ) 1985 දෙසැම්බර් මස 31 දින අංක 03 1985 දරණ නියමාවලිය යටතේ පිහිටවූ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූලික අරමුණු ඇත. එනම් පශ්චාත් උපාධි මට්ටමේ ඉගැන්වීම, වෘත්තිමය පුහුණුව, පර්යේෂණ පැවැත්වීම සහ පුරාවිද්‍යාව සහ අදාල විෂයන් දැනුම ප්‍රචාරණය වේ. ඒ අනුව බලන කල ඒක ශිෂ්‍ය පිරිවැයක් ගණනය කිරීමෙන් ශ්‍රී ලංකා ජනරජය මෙම ආයතනයෙන් අපේක්ෂා කරන කාර්‍ය්‍ය සම්බන්ධව පවතින ආයතනික යථාර්ථයේ ඇති සංකීර්ණතා පිළිබිඹු නොවේ; ආයතනය මූල්‍ය ප්‍රතිපාදන සහ ආයතනයේ වගකීම් අතර ඇති සම්බන්ධය ඉන් ප්‍රකාශ නොවේ. එබැවින් ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ අදහස ප්‍රකාශයට පත්කිරීම හා එකඟ නොවෙමි. |
| 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා<br><br>නිලගිරි සෑය හා හැඩඹය නිම්නයේ යෝජිත ගවේෂණය සඳහා රු.648,600 ක ඇස්තමේන්තුවක් මෙම ආයතනය විසින් ඉදිරිපත් කර තිබූ අතර පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා රු.500,000 ක් වෙන්කර දී තිබුණි. මෙම ප්‍රතිපාදන යොදාගෙන 2011 අගෝස්තු මස ගවේෂණ අවසන් කර තිබුණද ඊ සම්බන්ධ අවසන් වාර්තා 2012 මැයි 31 දින වන විටත් නිකුත් කර නොතිබුනි. | 4.2 නීල ගිරි සෑය හා හැඩඹය නිම්නයේ යෝජිත ගවේෂණ කටයුතු 2011 ජුනි මස 14වන දින ආරම්භ කර ජුලි මස 09 වන දින අවසන් කර තිබේ. ඊට අදාල වාර්තා 2011 ඔක්තොබර් මස කලමනාකරණ මණ්ඩලයටත් පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයාටත් ඉදිරිපත් කර ඇත. කළමනාකරණ මණ්ඩල වාර්තාවේ ඡායාපිටපතක් මෙයට යාකර ඉදිරිපත් කරමි.<br>මෙම කරුණ අවස්ථා දෙකකදී පිටපත් සමග විගණනයට භාරදී ඇත. |

| | |
|---|---|
| 4.3 **අරමුදල් ඌන උපයෝජනය**<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br>(අ) ප්‍රාග්ධන හා පුනරාවර්තන කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන ජංගම ගිණුම් දෙකෙහි සමාලෝචිත වර්ෂය තුල අවම පැත්පතු ශේෂය පිළිවෙලින් රු. 9,854,289 ක් හා රු.6,019,467 ක් වශයෙන් සාමාන්‍ය ඉතිරියක් පැවති අතර එම අතිරික්ත මුදල් කෙටිකාලීන ආයොජනයක යොදවා ආදායම් උපයා ගැනීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | විගණන විමසුමේ දක්වා ඇති ජංගම ගිණුම් තුල ඇති අතිරික්ත මුදල් භාණ්ඩාගාර ප්‍රතිපාදන බැවින් ආයෝජනය කිරීමට කටයුතු නොකරන ලදී. එහෙත් විගණන විමසුම මගින් පෙන්වා දි ඇති පරිදි කටයුතු කිරීම සඳහා අදාල ජංගම ගිණුම්තුල වු අතිරික්ත අරමුදල් කෙටිකාලීන / මධ්‍ය කාලීන ආයෝජනවල යෙදීම සඳහා මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ඉල්ලා ලිපියක් 2012-07-23 දින යවා ඇත. එසේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය සහිතව ද 2012-08-22 දින නැවත ලිපියක් යවා ඇත. ඒ සඳහා මහභාණ්ඩාගාරයේ අනුමැතිය ලද විගස අදාල අරමුදල් ආයෝජනය කිරීමට කටයුතු කරනු ඇත. |
| (ආ) පුනරුත්ථාපන හා වැඩි දියුණු කිරීම් සඳහා ලැබී තිබු ප්‍රතිපාදන වර්ෂ ගණනාවක සිට ඌන උපයෝජනව පැවති අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස 31 දිනට එසේ ඌන උපයෝජනව පැවති ප්‍රතිපාදනවල වටිනාකම රු.7,381,803 ක් විය. | දක්වා ඇති රු. 7,381,800/- මුළු අගය සඳහාම අදල කොන්ත්‍රාත්තු පවරා ඇති අතර එම කොන්ත්‍රාත්තු වැඩ දැනට නිමවෙමින් පවතින බැවින් බිල්පත් ගෙවා අවසන්වී නොමැති නිසා මුදල් ඉතිරි වී ඇති බවක් පෙනේ. එහෙත් මෙම මුදල් ශේෂය උපයෝජනය වී ඇත. මෙම මුදල්වලට අදල බිල්පත් බොහොමයක් මේ වනවිට ගෙවා ඇත. |
| 4.4 **පුස්තකාල පරිපාලනය**<br>සමාලෝචිත වර්ෂය අවසාන වන විට වටිනාකම රු. 62,455 ක් වු පුස්තකාල පොත් 37 ක් ආපසු භාරදී නොතිබුණි. | 2012-10-23 වන දින සිට 2012-12-23 දක්වා පොත් නැවත භාරදීම සඳහා කාලය ලබා දී ඇත. මෙම මාස 2ක කාලය ඇතුලත පොත් භාර නොදුනහොත් සති 2ක් ඇතුලත අයකර ගැනීමට කටයුතු කරන අතර ඒ දක්වා භාර නොදෙන පුද්ගලයින්ගේ නම් විගණන කමිටු තීරණය මත කළමනාකරණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. |

| | |
|---|---|
| 5. <u>පද්ධති හා පාලන</u><br><br>විගණනයේදි නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වර්ෂවර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත දැනුම් දෙන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.<br><br>(අ) ගිණුම්කරණය<br><br>(ආ) විවිධ අත්තිකාරම්<br><br>(ඇ) පුස්තකාල පරිපාලනය | (අ) ගිණුම්කරණය<br><br>(ආ) විවිධ අත්තිකාරම්<br><br>(ඇ) පුස්තකාල පරිපාලනය<br><br>ඉහත කරුණු කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |